Department of Humanities, Rajarata University of Sri Lanka

The Journal of Studies in Humanities

*Volume 4 (II) 2018*

# පුරාතන ලංකාවේ ආර්ථික පුනර්ජීවනයේ සන්ධිස්ථානයක්: මහින්දාගමනය

**එම්. කේ. එල්. අයිරාංගනී**

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.

*Email: iranganimkl@yahoo.com*

## Abstact

The visit of Mahinda Thera in the 3rd Century BC Sri Lanka can be recognized as a historical event that significantly contributed to the transformation of the culture of the country. This paper aims to study how the incident of Mahinda Thera's visit contributed to the economic prosperity of the country. In the past, Sri Lanka had a strong relationship with the Indian sub-continent. Thus, the study critically investigated how Mahinda Thera's visit contributed to making a revolutionary change in the country particularly with the acceptance of Buddhist philosophy by the king and people. The study primarily used the historical-comparative method and critical theory approach as a methodological approach to achieve study objectives.

**Keywords**: Mahinda Thera, economic prosperity, transformation, buddhist philosophy, ancient Sri Lanka

## හැඳින්වීම

ශ්‍රී ලංකාද්වීපයත් භාරතයත් අතර පැවති ජන සංක්‍රමණ සහ අනෙකුත් සම්බන්ධතා ක්‍රි.පූ. හයවැනි සියවසින් ද බොහෝ ඈතට ගමන් කරයි. ලක්දිව පිළිබඳව රාමායණය සහ මහාභාරත කතුවරුන් සිදුකර ඇති ප්‍රකාශන මෙන්ම පොම්පරිප්පු කැණීම්වලින් ලැබුණු මිනී ඇට සහිත බඳුන් සහ ගල් ඔය නිම්නයේ ගල් ගෙවල්වලින් සොයාගෙන ඇති වර්ෂ 2000ක් තරම් පැරණි අක්ෂර (හිත්තටියේ උදිත හිමි, 1989:44) ආදිය නිසි කාල නියමයන්ගෙන් තහවුරු කරගතහොත් මෙම සබඳතාවන්ගේ සැබෑ පෞරාණිකත්වය අනාවරණය කරගත හැකි වේ. මෙසේ සිදු වූ ඉන්දීය ජන සංක්‍රමණ හරහා භාරතීය සංස්කෘතියෙහි අභාසය අප සමාජයට වරින්වර හිමි වූවත් හෙළ සංස්කෘතියෙහි පැහැදිලි සංධිස්ථානයක් මෙන්ම හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරනුයේ ක්‍රි.පූ. තෙවැනි සියවසේදී සිදු වූ මිහිඳු හිමියන්ගේ ආගමනය යැයි පෙන්වා දීම අතිශයෝක්තියක් නොවේ. එතෙක් පැවැති ආගමික, සමාජ, ආර්ථික මෙන්ම දේශපාලන සහ

කලාත්මක යන සමාජීය සන්දර්භයන් රැසක පැහැදිලි ප්‍රගමනයක් සිදු කරමින් ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි කොඳු නාරටිය සකස් වීමෙහිලා ක්‍රි.පූ තෙවැනි සියවසේ දී සිදු වූ මහින්දාගමනය සහ දුමින්දාගමනය සමඟින් සකස් වූ පදනම හේතු විය. විවිධ ආගමික ලබ්ධීන් ට නතු වී සිටි මෙරට ජනතාව එක් පිළිගත් ආගමික දර්ශනයක් වටා ඒකරාශී කිරීමෙන් ඔවුන්ගේ ආධ්‍යාත්මික ගුණවගාව, පරිත්‍යාගය, හා කරුණාව මෛත්‍රිය පමණක් නොව ජාතියක් ලෙස එක්ව නැගී සිටීමටත්, සංවිධිත දේශපාලන පසුබිමක් ගොඩනගා ගැනීමටත්, ආර්ථික උන්නතියට මඟ පාදමින් ලෞකික සංවර්ධනය වඩා වර්ධනය කර ගැනීමටත් හේතු විය.

## පර්යේෂණ අරමුණ හා ක්‍රමවේදය

විවිධ අංශයන් තුළින් ධනාත්මක පරිවර්තනයන් රැසක් පෙන්නුම් කළ මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය මෙරට ආර්ථික පුනර්ජීවනයෙහිලා කුමන බලපෑමක් කළේද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ලංකාවාසීන් ආසන්න ඉන්දීය උපමහද්වීපයත් සමඟ අනාදිමත් කාලයක සිට ම සංස්කෘතික සම්බන්ධතා පැවත් වුවත් ක්‍රි.පූ. තෙවැනි සියවසේ බුදුදහම නිල වශයෙන් හඳුන්වා දීමෙන් පසු රජු ප්‍රමුඛ රටවැසියා බෞද්ධ දර්ශනය වැළඳ ගැනීමත් සමඟ සිදු වූ පරිවර්තනය විග්‍රහ කළ හැක්කේ විටින් විට සිදුවන තවත් එක් හුදෙකලා සිද්ධියක් ලෙස ද, නැතිනම් එය ලාංකේය ඉතිහාසයේ නව පරිච්ඡේදයක් විවර කළ විප්ලවීය වෙනසක් (Revolutionary change) ද යන්න පරික්ෂා කිරීම මෙහි තවත් අරමුණක් වේ. ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම අවශතාව අනුව ද්විතියික මූලාශ්‍රයෙන් දත්ත ඒකරාශී කරගන්නා ලද මෙම අධ්‍යයනයෙහි දී විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදයත් (Historical Comparative methord) සහ විචාරාත්මක ප්‍රවේශය (Critical theory) යන ක්‍රමවේදයත් උපයුක්ත කොට ගන්නා ලදී.

## සාකච්ඡාව

මහින්දාගමනයත් සමඟ මෙරට අර්ථක්‍රමයේ සිදු වූ චලනතාවයන් හඳුනා ගැනීමට නම් ඊට පූර්වයේ පැවැති ජීවනෝපායන් පිළිබඳ නිරවුල් අවබෝධයක් අවශ්‍යය වේ. පූර්ව ඓතිහාසික අවධියේ මෙරට ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගැනීමේ දී වෙළෙඳාම, හේන් වගාව, වී වගාව, කුඩා කර්මාන්ත, දඩයම සහ සත්ත්ව පාලනය වැනි ජීවනෝපායන් මූලිකව පැවැති බව පුරාවිද්‍යාත්මක අවශේෂ සහ සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරුවලින් පැහැදිළි වේ. දිව්‍යාවදානයේ ඇති තොරතුරුවලින් හෙළිවන පරිදි විජය යනු වෙළෙන්දෙකුගේ පුත්‍රයෙකි (සිරිවීර, 2012:41). වළාහස්ස ජාතකයේ වෙළෙන්ඳන් වසඟයට ගත් රත්නද්වීපයේ සිටි යක්ෂණියන් පිළිබඳ සඳහන් වී ඇත (**පන්සිය පනස් ජාතක පොත් වහන්සේ**, 1995:556). මෙරට ජනාවාස පිළිබඳව චීන ජාතික පාහියන් හිමියන්ගේ වාර්තාවලින් ද පැහැදිලි වන්නේ විදේශීය වෙළෙඳ පිරිස් සමඟ සබඳතා මුල් අවධියේ පටන්ම පැවති බවයි (සිරිවීර, එම:41). මහාවංසගත විජයාගමනය පිළිබඳ කථා පුවතේ ද කුවේණිය විසින් අල්වාගනු ලැබූ වෙළෙඳ නැව් සහ එම නැව්හී තිබූ විවිධ වර්ගයේ සහල් (**මහාවංසය**, 2012:7:24-25, 35) පිළිබඳව ද, විජය සහ කුවේණිගේ රාජ්‍යයේ විසූ යක්ෂ සේනාව සමග පැවති ගැටුමේ දී භාවිත කළ අවි ආයුධ ( එම, 7:37,35) පිළිබඳව ද, කුවේණියගේ කපු කැටීම (එම,7:11,34) ආදී තොරතුරු හරහා තත් අවධියේ මෙරට පැවති දෙස් විදෙස් වෙළඳාම, සහල්, කපු ආදී බෝග වගාව ප්‍රමුඛ වූ කෘෂිකර්මාන්තය, රෙදි විවීම සහ ආයුධ තැනීමේ කර්මාන්ත ඇතුළු ආර්ථික ක්‍රියාකාරකම්

පිළිබඳ ඉඟියක් සැපයේ. මින් පසුව පණ්ඩුකාභය පුරාවෘත්තය සැලකිල්ලට ගැනීමේ දී තත්සමයේ වාස්තුවිද්‍යා ලක්ෂණවලට අනුකූල වූ (රජ මැදුරක්, ආගමික සිද්ධස්ථාන, නාගරික ජල අවශ්‍යතාවය සම්පූර්ණ කළ වාපී කර්මාන්ත සහ සතර දොරටුවෙන් ආරක්ෂා වූ) සැළසුම් සහගත නගර නිර්මාණයක් අනුරාධපුරය කේන්ද්‍ර කොටගෙන සිදු වීම මෙරට ආර්ථික ක්ෂේත්‍රයේ පැහැදිලි ප්‍රගමනයක් පෙන්නුම් කළේය. මෙම සංවිධිතභාවයත් සමඟ වාරි කර්මාන්තයන් (එම,10:83,88:45-46), ශ්‍රමිකයින් යොදවා සිදුකරනු ලබන කුඹුරු වගාව (එම, 10:30-32,43), ගොපළු පාලනය (එම, 10:14-17,42), නැකැත් ශාස්ත්‍රය (එම. 10:75, 45), දාස සේවය (එම, 9:5,22-10:1, 41-42) මෙන්ම නගර ගුත්තික (එම, 10:180,45), නගර ශෝධක (එම, 10:91,46), නාගරික වැසිකිලි ශෝධක (එම, 10:91-92, 46), මෘත දේහ සම්බන්ධ කටයුතු සහ සොහොන් ගොව්වන් (එම, 10:92-93, 46) ඇතුළු නාගරික පරිසරයක් තුළ දැකියහැකි සේවා හා වෘත්තීන් ගණනාවක් මේ වනවිටත් ගොඩනැගෙමින් පැවති බව අනාවරණය කරගත හැකිය. තවද මහාවංසයෙහි අනුරාධපුරයෙහි මහ සීමා බන්ධනය පිළිබඳ විස්තර කථනයේදී කම්මාර දේවතා හෙවත් කඹුරු දෙවි (ලෝකුරුවන්ගේ කර්මාන්තයට අධිපති) විමාන සීමාවක් ගැන සඳහන් වීමෙන් (එම, 15:203, 69) ලෝහ කාර්මිකයින් වූ බව සනාථ වෙයි. එසේම ප්‍රභූන් මහා පරිමාණ කුඹුරු සේවක ශ්‍රමය යොදා ගනිමින් සිදු කළ බව පණ්ඩුකාභයගේ මාමා කෙනෙකු වූ ගිරිකණ්ඩසිව කරීස සියයක (අක්කර අටසියයක (වල්පොළ රාහුල හිමි, 2002,24)) කුඹුරක් කරවූ බව සඳහන් ප්‍රවෘත්තියෙන් හඳුනාගත හැකි වේ. එහෙත් මෙම පුරාවෘත්ත තුළින් හෙළිවන කරුණුවලට පාදක වූ කාලය සහ මහාවංසය ආදී ඉතිහාස මූලාශ්‍රයන් සම්පාදනය වූ කාලය අතර දීර්ඝ කාල පරතරයක් පැවතීමත්, සංසන්දනාත්මක විග්‍රහයකට ඉඩකඩක් නොවීමත් ආදී කරණු සැළකීමේ දී පුරාවෘත්ත මත මුළුමනින් ම රැඳී නිගමනවලට එළඹීම යෝග්‍ය නොවේ.

මෙසේ පූර්ව ඓතිහාසික අවධියේ ආර්ථික රටාව අධ්‍යයනය කිරීමේදී අනුරාධපුර ඇතුළු නුවර, කරෛනගර්, අනායිකොඩ්ඩයි, පොම්පරිප්පු, කන්තරෝදයි, තිස්සමහාරාම සහ මාන්තෛයි කැණීම් තුළින් හෙළිවන පුරාවිද්‍යා සාධක මත මෙරට ජනයා මෙගලිතික සහ යකඩ යුගවලදී ද(ක්‍රි.පූ.900-600) කාල-රක්ත මැටි බඳුන් සහ රක්ත වර්ණ වැටි බඳුන් (Iron slag, Shark bone) භාවිත කළ බව හෙළි වේ (Daraniyagala,1990:150-153). මේ අනුව සමකාලීනව ආහාර පිස අනුභව කළ බවටත්, හේන් වගාවෙහි නියුතුව සිටි බවටත්, දෙස් විදෙස් වෙළහෙළඳාම් පැවති බවටත් (අශ්ව ලාඩමක් හමුවීම), මැටි භාණ්ඩ නිපදවීමේ තාක්ෂණය මෙන්ම විජයාගමනයට වසර දෙසීයයකට පූර්වයෙහි පටන් ම මෙරට නාගරීකරණයෙහි ශේෂයන් පැවති බවටත් (**මහාවංසය,** 15:203, 69) සාධක හඳුනාගෙන ඇති හෙයින් මැටි කර්මාන්තය, ශිලා මෙවලම් නිර්මාණය සහ ලෝහ නිෂ්පාදනය ආදී කර්මාන්තයන් පැවති බව තහවුරු වේ. එහෙත් මෙම එක් එක් ආර්ථික කටයුතු පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හෝ ඒවායෙහි ක්‍රමික විකාශය හඳුනාගැනීමට මෙම මූලාශ්‍රය ප්‍රමාණවත් නොවේ.

දිවයිනේ ඉතිහාසයේ ලිඛිත මූලාශ්‍රයත්, සෙල්ලිපි ප්‍රමුඛ පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුවත් විධිමත් ආර්ථික ක්‍රමයක් පිළිබඳ තොරතුරු හැදෑරීමට අවකාශ ලැබෙන්නේ ක්‍රි.පූ.තෙවැනි සියවසින් පසුවයි. වංශකතා සාධක සැළකිල්ලට ගැනීමේදී තත් අවධියේ බුදු සමයේ ආභාසයට ලක් වූයේ සිංහල ජනයාගේ හුදු ආගමික ජීවිතය පමණක් නොවේ. එහි බලපෑම සැබැවින්ම ඊට වඩා බෙහෙවින් තියුණු වූ අතර සංස්කෘතියක් වශයෙන් සෑම අංශයකම ධනාත්මක වෙනසකට හේතු විය. මේ සමගින් ලක්වාසීන්ට අලුත් ජීවන මාර්ගයන් ද, ජීවත් වීමේ නව්‍ය පරමාර්ථයන් ද බුදු දහමේ බලපෑමෙන් හිමි විය.

කිසියම් රටක පවත්නා අර්ථක්‍රමයෙහි සැළකිය යුතු සංවර්ධනයක්, එසේත් නැතිනම් පෙර නොවූ විරූ ධනාත්මක හැරවුමක් සිදු වීමට බලපාන ප්‍රධාන සාධක කිහිපයක් පවතී. එනම්,

01. දේශපාලන ස්ථායිතාවය

02. ආකල්පමය සහ බුද්ධිමය සංවර්ධනය

03. සාක්ෂරතාවය, සන්නිවේදනය සහ තාක්ෂණික දියුණුව

04. සම්පත් කළමනාකරණය (ස්වභාවික සම්පත්, මානව සම්පත් සහ භෞතික සම්පත්)

උක්ත සාධකයන් සියල්ල සමෝදානය වූ දුර්ලභ සංධිස්ථානයක් වශයෙන් ක්‍රි.පූ. තෙවැනි සියවස හඳුනාගත හැකි වේ. පළමුවෙන් ම **දේශපාලන ස්ථායිතාව** සැළකිල්ලට ගැනීමේදී ක්‍රි.පූ. සවැනි සියවසේදී සිදු වූ විජයාගමනයේ සිට ක්‍රි.පූ. සිව්වැනි සියවසේ පණ්ඩුකාභය අවධිය දක්වා ම ප්‍රාදේශීය පාලකයින් අතර නායකත්ව අරගල සිදුවන විභේදනීය දේශපාලන පසුබිමක් දැකගත හැකි වේ. එහෙත් ක්‍රි.පූ. තෙවැනි ශතවර්ෂයේ දෙවැනි පෑතිස් රාජ්‍යය සමයේ දී පැවති විදේශ ප්‍රතිපත්තිය තුළදී අශෝක අධිරාජ්‍යයා සමඟ ගෙන ගිය සමීප සබඳතාවල ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍යය පාලනය ස්ථාවර කරගනී. එහිලා උපයුක්ත එක් උපායමාර්ගයක් ලෙස ආගම භාවිතයට ගැනීමක් තිස්ස රජු විසින් ද අනුගමනය කළ බව හඳුනාගත හැකි වේ. මෙහිදී අනුරාධපුර පාලකයාට විධිමත් රාජාභිෂේකයක් සිදුකිරීමට අවශ්‍ය සියළු උපකරණ අසල්වැසි රාජ්‍යය පාලකයා වූ අශෝක අධිරාජ්‍යයා විසින් එවන ලදි (**මහාවංසය,** 11:28-32:48). මෙම උපකරණ ආධාරයෙන් තිස්ස රජු දෙවැනි අභිෂේකයක් ලබාගත් අතර අශෝක අධිරාජයාගේ උපාධි නාමය වූ 'දේවානම්ප්‍රිය' යන විරුදය ද තිස්ස රජුට පිරිනැමූ බව පෙනේ (**මහාවංසය,** 11, 41-42:49/ වල්පොල රාහුල හිමි, 2002:31.). අභිලේඛන සාධකවලින් තහවුරුවන පරිදි තත් අවධියේ ගමණී (Nicholas, 1949:244-246), රජ, පරුමක, අය ආදී විරුද නාමයන් දරූ ප්‍රාදේශීය නායකයින් (Gunawardana, 1981-82:7-8.) ලක්දිව සිසාරා පැතිර සිටි බැවින් අනුරාධපුර පාලකයා වූ තිස්ස රජු තම බලය අනෙකුත් ප්‍රාදේශීය පාලකයින් අභිබවා ඉහළට ඔසවා ගැනීමට මෙම විධිමත් අභිෂේකය හෙවත් භාරතීය ක්‍රමවේදයට අනුව සිදුකළ දෙවැනි රාජාභිෂේකය උපක්‍රමශීලීව යොදාගත් බව පැහැදිලිය. මෞර්ය ආභාසය මත රජ, මහරජ, දෙවනපිය වැනි විරුද නාම තිස්ස රජු පිළිබඳ සඳහන් බ්‍රාහ්මී සෙල්ලිපි සහ සාහිත්‍යය මූලාශ්‍රවල දක්වෙන බැවින් අනුරාධපුර පාලකයාට පාලන කටයුතු තුළ විශේෂත්වයක් හිමිව ඇති බව තහවුරු වේ.

මෙසේ විධිමත් රාජාභිෂේකයක් සිදු කිරීම හා 'දෙවනපිය' අභිධානය භාවිතයට ගැනීමත් (**මහාවංසය,** 11:41-42:49) සමඟින් කිසිදු ප්‍රාදේශීය පාලකයෙකුගේ විරෝධයකින් තොරව දිවයිනේ සංස්කෘතික පුනරුදයේ පෙරගමන්කරුවා බවට පත්වන බව පෙනේ. එබැවින් ප්‍රාදේශීයව පවත්වාගෙන ගිය ගෝත්‍රගත ලක්ෂණ සහිත දේශපාලන ඒකක බුදු දහම නමැති යදමින් එකිනෙක පුරුද්දා ප්‍රාදේශීයත්වය වෙනුවට දීපවාසී අනන්‍යතාවක් ඇති කරමින් ඒකීය සංස්කෘතික පෙළහරකට ඒකාබද්ධ කිරීමට දෙවනපෑතිස් රජ දවස හැකියාව ලැබුණි. මෙය ඒකීය රාජ්‍යය සංකල්පය පිළිබඳ දේශපාලන දර්ශනයක් නොවන බව පැහැදිලි මුත් එසේ ගොඩනැගුණු බොදුනු සංස්කෘතියක අනන්‍යතාවය මෙරට අන්‍ය

සමාජීය ක්ෂේත්‍රයන්ට මෙන්ම ආර්ථික පුනරුදයකට ද මහෝපකාරී විය. දේශපාලනමය වශයෙන් රට ඒකඡත්‍ර නොවූවත් තත් අවධියට අදාලව දිවයිනේ දස දෙසින් හමුවන බ්‍රාහ්මී සෙල්ලිපි මූලාශ්‍රගත දත්ත සැළකිල්ලට ගත්විට ඔවුන් බුදු දහමින් ලද ආධ්‍යාත්මික ගුණ වගාව හරහා ඒකාබද්ධව, එක්සත්ව සිටි බව පැහැදිලි ය. ඒ තුළ ජාති, ආගම් හෝ කුල භේද නොවීය. විශේෂයෙන් ම දකුණු ලංකාවත් අනුරාධපුරයත් අතර සංස්කෘතික සහ දේශපාලන සම්බන්ධතා පුළුල් ලෙස හඳුනාගත හැක්කේ දේවානම්පියතිස්ස අවධියේ සිට ය. මහාබෝධි රෝපණ උළෙලට කතරගම ක්ෂත්‍රියන් සහ චන්දනග්‍රාමයේ ක්ෂත්‍රියන් පැමිණීමෙන් පෙනී යන්නේ ඔවුන් අනුරාධපුර ක්ෂත්‍රිය පරම්පරාව සමඟ මිත්‍රත්වයක් ගොඩනගා ගත් බවයි. දේවානම්පියතිස්සගේ සහෝදර මහානාග කුමරු අනුරාධපුර අග්‍ර මහේෂිකාවගේ අභියෝගය හමුවේ රෝහණයට පළායන්නේත්, එහි ප්‍රාදේශීය නායකත්වයට පත් වූයේත් (එම, 11:41-42:49) මෙසේ ගොඩනැගුණු මිත්‍ර සම්බන්ධතා හේතුවෙනි. බුදු දහම නමැති යදමින් මෙම ප්‍රාදේශීය නායකයින් තුළ ඒකමතික භාවයක් ඇති කිරීමෙන් පසුව බොදුනු දර්ශනය දිවයින පුරා ව්‍යාප්ත වූ අතර එමගින් එක් දර්ශනයක් වටා පාලකයිනුත්, පාලිතයිනුත් සමෝධානය කරගැනීමට හැකි විය. බුදු දහමේ ආලෝකය දිවයිනේ සිව් දිශාවට විහිදීමත් සමඟ එතෙක් හුදෙකලාව දුරස්ව පැවති ගම් නියම්ගම් යා කළ මාවත් බෞද්ධ වෙහෙර විහාරස්ථාන යා කරමින් ජාලගත වන්නට විය. මෙය රටේ අනෙකුත් අංශයන්ට මෙන්ම ආර්ථික සංවර්ධනයට ද බලපෑවේ ය.

බුදු දහමේ ආගමනයත් සමගින් මෙරට ධර්මද්වීපයක් වූවා පමණක් නොව රාජ්‍යය පාලකයා නිසැකයෙන්ම බෞද්ධයෙකු විය යුතුය යන පිළිගැනීම සමාජගත විය. මෙම විශ්වාසය කෙතෙක් වර්ධිතව ඉදිරියට ගියේ ද යත් ක්‍රි.ව. දහවැනි සියවස වනවිට මෙරට පාලකයා බෞද්ධයෙකු විය යුතුය යන්න පමණකින් නොසෑහී බෝධිසත්වවරයෙකු විය යුතුය යන්න විශ්වාසයට පත් බව සිව්වැනි මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපියකින් හෙළි වේ (*Epigraphiya Zelanica,* 1994:234-240). රටේ පාලකයා බෞද්ධ ප්‍රතිපත්තීන් හී පිහිටා ක්‍රියා කිරීමෙන් පාලන පහසුවක් ඇති වූවා පමණක් නොව මහජන ප්‍රසාදය දිනා ගනිමින් සුබසාධනමය කටයුතු වර්ධනය වීමට ද හේතු විය. මෙම ආකල්පමය වෙනස කෙතරම් සමාජගත වූයේ ද, පිළිගැනීමට ලක් වූයේ ද යත් දමිළ පාලකයින් පවා ඊට අනුගත වීමෙන් පෙනේ. නිදසුන් වශයෙන් විදේශීයන් වූ සේන ගුත්තික දෙදෙනා 'දැහැමෙන්' රාජ්‍යය පාලනය කළ බවත් (**මහාවංසය,** 21:11:89), එළාර පවා 'පෙර සිරිත' හෙවත් රටේ සම්මත සිරිත් අනුගමනය කළ බවටත් **මහාවංශය** පෙන්වාදෙන සාක්ෂි අනුව හඳුනාගත හැකි වේ (එම. 21:21-22:90). අනුරාධපුරයේ බුද්ද පාරින්ද රජු විසින් පිහිටුවා ඇති සෙල්ලිපියට අනුව 'බුදදස' හෙවත් බුද්ධදාස යන විරුදය (*Epigraphiya Zelanica,* 1943:114) භාවිත කළ අතර පාරින්ද, තිරීතර, දාඨිය වැනි දමිළ පාලකයින් ද බෞද්ධාගමට අනුග්‍රහ කරමින් රට පාලනය කර ඇති බව සෙල්ලිපි මූලාශ්‍ර මගින් තහවුරු වේ (*Epigraphiya Zelanica,* 1943:218).

තිස්ස රජු සහ අශෝක අධිරාජ්‍යයා අතර පැවති රාජතාන්ත්‍රික සබඳතාවන් නිසාවෙන් ලැබුණා වූ බුදු දහම දේශීයන්ගේ **ආකල්පමය සහ බුද්ධිමය සංවර්ධනයට** සෘජුවම බලපෑවේ ය. වංශකතාවන්ට අනුව තිස්ස රජු අශෝක අධිරජු වෙත යැවූ දූතයින් වෙත රාජාභිෂේකයට අවශ්‍ය උපකරණ ලබා දුන් අධිරාජ්‍යයා විසින් එම දූතයින් අත දහම් පඬුරක් ද එවීය. එනම්,

> "මම බුදුන්, දහම්, සඟ සරණ ගත වූයෙමි. ශාක්‍ය පුත්‍ර බුදු සසුනෙහි උපාසක බැව් ගිවිස්සෙමි. නරෝත්තමය තෙපි ද ශ්‍රද්ධාවෙන් සිත පහදාගෙන තුණුරුවන් සරණ යව" (**මහාවංසය,** 11:34-35:48)

යනුවෙන් ධර්මාශෝක අධිරාජ්‍යයා තිස්ස රජුට ද බුදු දහම වැළඳගන්නා මෙන් දැක්වීමත්, පසුව මිහිඳු තෙරුන් හමුවේ බුදු දහම වැළඳ ගැනීමත් හරහා ඔහු මෙරට සිටි ප්‍රාදේශීය පාලකයින් අතරින් තෙරුවන් සරණ ගිය පළමුවැන්නා බවට පත්විය. පසුව මෙරට බුදු සසුන පිහිටුවීමේ, ව්‍යාප්ත කිරීමේ, මහජනයා සුමගට ගැනීමේ ව්‍යාපාරයේ පෙරගමන්කරුවා බවට දේවානම්පියතිස්ස පත් වූවා පමණක් නොව එම නායකත්වය කිසිදු විරෝධයකින් තොරව මෙරට ප්‍රාදේශීය නායකත්වය විසින් සහ පොදු මහජනතාව විසින් ද පිළිගන්නා ලදි.


අනතුරුව සිදුවන මහාබෝධි ආගමනයේදී මූලිකත්වය ගන්නා තිස්ස රජු තම දේශපාලන ස්ථාවරත්වය වඩවඩාත් ශක්තිමත් කරගන්නා ආකාරය පැහැදිලි වේ. තිස්ස රජුගේ මූලිකත්වයෙන් සිදුවුණු මෙම බෝධි රෝපණ උළෙලට ලක්දිව විවිධ ප්‍රදේශවල එනම්, කාචරගාම, චන්දනගාම, තිවක්ක බමුණුගම ආදියේ විසූ ප්‍රාදේශීය පාලකයින් සහ බ්‍රාහ්මණ පූජකයින් අනුරාධපුරයට රැස් වූවාක් (එම, 19:52-53:83) මෙන්ම ඔවුන් මහා බෝධියෙන් හටගත් අංකුර බෝධීන් වහන්සේලා තිස්ස රජුගෙන් ලබාගෙන තම පාලන ප්‍රදේශයන් වෙත වැඩම කරවමින් රෝපණය කර බෞද්ධාගම පිළිගත් බවටත්, මෙකී ආගම සමඟින් බැඳි සංස්කෘතික පුනරුදයට එකග වන්නේය යන පණිවිඩයත් සපයා ඇත. මේ අනුව බෝධියෙන් හටගත් ශාඛාවන් දඹකොළ පටුන, තිවක්ක බමුණුගම, ථූපාරාමය, කසුන්ගිරි වෙහෙර, සෑගිරිය, කතරගම, සඳුන්ගම, මල්වැස්සා වෙහෙර, තන්ත්‍රිමාල වෙහෙර, මහාජල්ලික වෙහෙර, කෙවුල්ගම, කොට්ටියාරම, පොළොන්නරුව, මාතලේ, රුසීගම, රුහුණු රට මාගම, විල්වල, මධ්‍යංගණය, සේරුවිල, විල්ගම්වෙහෙර, ඌවේ මුතියංගණය, බුලත්ගල හප්පෝරු වෙහෙර, සිතුල්පව්ව, වනවාස වෙහෙර, වැලිගම් වෙහෙර, පරගොඩ, මැද්දේගම, ගණේගම, කොත්මලේ, පුසුල්පිටිය, මායාරට වතුරේ, බෙලිගල, බෙල්ලන්විල, වඳුරව, වට්ටාරම, සුළගල්ල, රැස්සේරුව, කටියාව, ගිරිබා වෙහෙර, යාපව් සුන්දරගිරි පර්වතය, කසාගලු වෙහෙර සහ අඹලවරහන්ගල වෙහෙර ආදී වශයෙන් ලංකාවේ සිව් දිශාවෙහි ම (**සිංහල බෝධිවංශය,** 2018:245) රෝපණය කරවා ඇත.

මෙසේ බුදු දහම තුළින් සිදු වූ සමාජමය පරිවර්තනයත් සමඟින් අනුරාධපුර පාලකයින් සහ බමුණන් වැනි සමකාලීන අවධියේ රාජ්‍යය අනුශාසකයිනුත්, රටවැසියනුත් බෞද්ධ උපාසක-උපාසිකා යන පොදු නාමද්වය යටතට ගොනු වීම හා මෙම පාලක-පාලිත දෙපක්ෂයටම ඉහළින් සිටි භික්ෂු-භික්ෂුණී යන බුද්ධ පුත්‍රයින් පිරිසක් සමාජය මෙහෙයවීමත් කරණකොටගෙන භාරතීය සමාජයේ චතුර්වර්ණය මූලික කරගනිමින් පැවති සමාජ ස්ථරායනයන් මෙරටට සම්ප්‍රේෂණය වීම වැළකී, නැවුම් ආරක සමාජ පෙළගැස්මක් මෙරට තුළ සිදු වූ බව හඳුනාගත හැකි වේ. එහෙයින් ප්‍රාග් බෞද්ධ භාරතීය සමාජය තුළ මුල්බැසගෙන තිබූ උස්-පහත් කුල භේද, වර්ණ භේද, ලිංග භේද ආදී බේද භින්නතාවන්ගෙන් තොරව පාලකයා ඇතුළු සමස්ත මහජනතාව තෙරුවන් සරණ ගිය උපාසක උපාසිකා ලෙස යුගලගත කිරීම සමාජ සමානාත්මතාවයට හේතු විය.

පාලකයා විසින් බුදු දහම වැනි තාර්කික වූත්, මෙලොව පරලොව සුගතිය සඳහා මෙහෙයවනු ලබන්නා වූත් වැළඳ ගැනීමත්, ඊට අනුකූල වූ **ආකල්පමය සංවර්ධනයක්** ගොඩනගා ගැනීමත් රටේ ධනාත්මක පරිවර්තනයක් සිදු වීමට හේතු විය. බෝධි ආගමනයත් සමගම දෙවනපෑතිස් රජු රාජත්වයෙන් බෝධිය පිදූ බව සඳහන් වේ (**මහාවංසය**, 19:31:82). මෙතැන් සිට ලක්දිව බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූ බව මෙයින් සංකේතවත් කරයි. දේවානම්පියතිස්ස රජු කොතෙක් බුදු දහමට ලැදියාවක් දක්වූයේ ද යත් "ශාන්තිධරයන් වහන්ස මම සර්වඥයන් වහන්සේගේ ආඥාව ඇතුළත වාසය කරන්නෙමි. එහෙයින් පුරය ඇතුළත් කොට මහා සීමාව සම කල්හී බඳනා සේක්වා" (එම. 15:182-183:68) යැයි මිහිඳු හිමියන්ට ආයාචනා කිරීමෙන් පෙනී යයි. මින් පසු මෙරට බෞද්ධ හෙවත් ධර්ම රාජ්‍යයක් වීමත් දසරාජ ධර්මය මත පදනම් වූ දැහැමි දේශපාලන මාර්ගයකට අවතීර්ණ වීමත් හේතු කොටගෙන බෞද්ධ මූලධර්ම සහ ශික්ෂණයන් මත පදනම් වූ තිරසාර සංවර්ධනයක බිජු මෙරට රෝපණය වූ බව පැහැදිලි වේ. එබැවින් ලොව බොහෝ සංවර්ධිත රටවල් විසිවැනි සියවසේදී නොදියුණු රටවලට තිරසාර සංවර්ධනයේ මූලධර්ම ( Theories of the Sustainable development) පිළිබඳ හඳුන්වා දීමේදී ක්‍රි.පූ. සයවැසි සියවසේදීත් බුදු රජාණන් වහන්සේ විසින් භාරතයට එම ආර්ථික දර්ශනය හඳුන්වා දී තිබූ අතර මිහිඳු හිමියන් විසින් එම දර්ශනය මෙරටට ද හඳුන්වා දුන්හ. මෙතුළින් මහජනතාව තුළ නිවහල්වාදී මෙන්ම ධනාත්මක සිතිවිලි ඉහළ ගිය අතර එය එක් ජාතියක්, එක් රටක් වශයෙන් ආර්ථික උන්නතියක් කරා යාමට හේතු වී ඇත.

අනුරාධපුර නගරය කේන්ද්‍රගත වූ උතුරු ප්‍රදේශය මිහිඳු හිමියන් ප්‍රමුඛ භික්ෂු සංඝයාගෙ අවවාද අනුශාසනා පරිදි දේවානම්පියතිස්ස රජු විසින් සංවර්ධනය කරන අතරතුර 'ඉට්ඨිය' වැනි තෙරවරුන්ගේ උපදේශකත්වයෙන් බෝධි අංකුර රැගෙන යමින් බෞද්ධාගම පිළිගත් කතරගම ක්ෂත්‍රියන් සහ අනුරාධපුර රජ පෙළපතේ නියෝජිත මහානාම යුවරජු වැනි නායකයින් දකුණු ලංකාව බෞද්ධ දර්ශනයට අනුව සකස් කළේය. මේ අනුව රට පුරා බුදු දහම පැතිර යාමත් සමඟ එක් පසෙකින් ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනයක් සිදුවනවාත් සමඟම අනෙක් පසින් ධනාත්මක ආකල්පමය පරිවර්තනයක් ද සිදු වූ බව පැහැදිලිය.

මහින්දාගමනයත් සමගින් මෙරට ජන සමාජයේ '**බුද්ධිමය හා තාක්ෂණික වශයෙන් සිදුවන වර්ධනය**'ත් ආර්ථික පිබිදීමකට සෘජුව බලපාන ලදි. ක්‍රි.පූ. සවැනි සියවසේ සිට භාරතීය සමාජයේ විශාල බුද්ධිමය සහ තාක්ෂණික පරිවර්තනයක් සිදුවන අතර එවැනි සමාජීය පරිසරයකින් වරින් වර මෙරටට පැමිණි ජන කණ්ඩායම් සතුව ද එකී දැනුම පැවති බව පිළිගැනීමට සිදු වේ. විජය සහ පණ්ඩුකාභය පුරාවෘත්ත හරහා මෙවැනි තාක්ෂණික අංශය පිළිබඳ ලැබෙන සාක්ෂීන් එහිලා නිදසුන් වේ. පණ්ඩුකාභය රාජ්‍ය සමයේදී මෙරට නාගරීකරණ ක්‍රියාදාමය වඩාත් සැළසුම් සහගතව ආරම්භ වූවත් එය බෞද්ධ මුහුණුවරක් ඔස්සේ සැළකිය යුතු සංවර්ධනයක් කරා ළඟාවන්නේ ක්‍රි.පූ. තෙවැනි සියවසේ දෙවනපෑතිස් රජ දවස මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් මත නව අංගයන් ගණනාවක් එකතුවීමත් සමගිනි (එම. 15:82-213:68-70).



**සිතියම අංක 01:**
**අනුරාධපුර නගරය අවට පැරණි මාර්ග පද්ධතිය**
*https://www.archaeology.gov.lk*

ඒ සමගම මෙරට මහාමාර්ග සැලැස්ම අගනගරයත් වරාය නගරයනුත් යා කරමින් පුළුල් වීම නිසා අගනගරය කේන්ද්‍රකර ගනිමින් සිදුවන සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳ පණිවුඩය රට පුරා සන්නිවේදනය විය. මෙම තත්ත්වය සෘජුවම මෙරට ආර්ථික පිබිදීමකට හේතුවිය. සංඝමිත්තා තෙරණිය විසින් දඹකොළපටුනේ සිට මහා බෝධිය වැඩමවාගෙන ආ ගමන් මාර්ගයත් එම බෝධිය රෝපණය කිරීමේ මංගල්‍යයට කාජරගාම හෙවත් කතරගම සිට අනුරාධපුරය දක්වා ක්ෂත්‍රියයන් ආ ගමන් මාර්ගයත් සැළකීමේ දී අගනුවර සිට උතුරු වරායටත්, දකුණේ කතරගම හරහා ගොඩවාය වරාය දක්වාත් ව්‍යාප්ත වුණු ප්‍රධාන මාර්ග ද්විත්වයක් පැවත ඇති බව හඳුනාගත හැකි වේ.

මෙම මාර්ගයන් පසුව බහුලව භාවිත වූ නිශ්චිත මාර්ග බවට පත්විය. දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරු මහානාග කුමරු අගමෙහෙසියගේ කුමන්ත්‍රණයන්ගේන් මිදී මාගමට පලා යන්නේ (එම, 21:3-7:91) ද මෙම දකුණු මාර්ගයෙන් විය යුතු ය. උතුරින් ජම්බුකෝළය හැරුණුකොට මහාතිත්ථ, ගෝණගාම පට්ටන, මහාකන්දර මෝයෙහි වූ තොටුපල ආදියේ සිට අගනගරයට විහිදුණු

මාර්ග පද්ධතියක් ක්‍රි.පූ. තෙවැනි සියවසේ ගොඩනැගී ඇත. රටක මාර්ග පද්ධතිය පුළුල් වීම ආර්ථික සංවර්ධනයට සෘජුවම බලපාන බව විශේෂයෙන් කිව යුතු නොවේ.

රටේ ආර්ථික උන්නතියට අනුබල දුන් අනෙක් අංශය වූයේ වාරි කර්මාන්තයෙහි සිදු වූ නව්‍යකරණයයි. මෙය ක්‍රි.පූ. තෙවැනි සියවසින් සමාරම්භය ලද්දක් නොවූවත් ඉන් අනතුරුව සිදුවුණු දේශපාලන නායකත්වයෙහි ශක්තිමත්භාවයත් බුදු දහමින් බෞද්ධයාගේ ජීවිකාවෘත්තිය ලෙස කෘෂිකර්මාන්තයට ලබාදුන් අනුබලයත් පාලකයින්ට වාරි කටයුතු විෂයෙහි වඩ වඩාත් අවධානය යොමු කරවීමෙහි ලා අත්‍යවශ්‍ය පෙළඹවීමක් ලබාදෙනු ලැබී ය. සාහිත්‍ය මූලාශ්‍ර මඟින් පෙන්වා දෙන පරිදි පණ්ඩුකාභය රජු විසින් අභයවාපිය සහ ජයවාපිය කරවීමත් (එම, 10:83-88:45-46) සමඟ නාගරික ජල අවශ්‍යතාවය සාධනය කිරීම අරමුණු කොට ගත් වාරි කර්මාන්තය ආරම්භ වුවත් කෘෂික බිම් සංවර්ධනය කිරීම අරමුණු කරගත් වාරි කර්මාන්තයන් ආරම්භ වන්නේ ක්‍රි.පූ. තෙවැනි සියවසෙන් පසුවය.

එසේම මහින්දාගමනයත් සමඟ මෙරටට ලැබුණු **බ්‍රාහ්මී අක්ෂර හා ලේඛන කලාව** දිවයින පුරා ව්‍යාප්ත වීම මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ පදනම වූ අතර එය කුඩුමහත් සෑම අංශයකම වර්ධනයට සෘජුව බලපෑවේ ය. එමෙන්ම මෙම බ්‍රාහ්මී අක්ෂර අනුක්‍රමයෙන් වෙනස් වී භාෂාව වර්ධනය වූ අතර ත්‍රිපිටක ග්‍රන්ථවල ඇතැම් කරුණු පාලි හා සිංහල සාහිත්‍යයේ උන්නතියට හේතු විය. තව ද රජරට සභ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය විදහාපාන ගෘහ නිර්මාණ සහ වාස්තු විද්‍යාව ද නව මඟකට යොමුවන්නේ මහින්දාගමනයත් සමඟිනි. පූර්ව ඓතිහාසික අවධියේ දී එක්ටැම් ගෙයක්, සිවිකාශාලා, දෙවොල්, ආදිය ගැන කියැවෙතත් රජ මාළිගාවක්, පරිපාලන ගොඩනැගිලි හෝ මහජන නිවාස ආදිය ගැන නොකියැවේ. තිස්ස රජු පවා අති ගෞරවනීය මිහිඳු මහ රහතන් වහන්සේට නිවාසස්ථානය කොට දුන්නේ මැටියෙන් හදා පුළුස්සා ඉදිකළ කාලප්‍රාසාදයයි (එම, 15:221-223:70). මෙවැනි සුළු සුළු සාධක හමු වූවත් සැළසුම් සහගත නගර නිර්මාණකරණය පමණක් නොව බෞද්ධ කලා ශිල්ප හරහා මෙරට ජනයාගේ කලා නිපුණත්වය පරිපූර්ණ භාවයට පත්වන්නේ ද බෝධිහාර කුලයන් සමඟ මෙරටට පැමිණෙන ශිල්ප ශ්‍රේණීන් මෙරට සමාජානුයෝජනය වීමෙන් ඇති වූ දෙස් විදෙස් ශිල්පීය සංකලනයත් සමඟිනි.

විශේෂයෙන්ම බුදුදහම හුදු ආගමක් වශයෙන් ලඝු කළනොහැකි තාර්කික බුද්ධිය හා අවබෝධය විෂය කොට ගත් දර්ශනයක් බැවින් එය මිනිසුන්ගේ බුද්ධිවර්ධනයට බෙහෙවින් මහෝපකාරී විය. පාපකාරී ක්‍රියාවලින් මිනිසුන් මුදවනවා පමණක් නොව ඔවුන්ට ජීවත්වීමට නව අර්ථයක් හා ජීවන දර්ශනයක් මේ හරහා ලබා දුනි. පුද්ගලයකුගේ ආර්ථික දියුණුව; පවුලක, කුලයක, සමාජයක අභිවෘද්ධියෙහිලා හේතුවන ආකාරය බෞද්ධ දර්ශනයෙහි පෙන්වා දී ඇත. ජීවිතයක ඇති ප්‍රධානම දුක දරිද්‍රතාව බවත් ණයබර, පොලී ගෙවීම, ඒ මත චෝදනා ලැබීම දුකක් බව උන්වහන්සේ පෙන්වා වදාළහ. එබැවින් මිහිඳු සමයෙහි නව ප්‍රබෝධයක් ලද ලාංකේය ජනතාව එතැන් සිට වාරි කර්මාන්තය මුල්කරගත් කෘෂිකර්මාන්තය ජීවනාලිය කර ගනිමින් ස්වයංපෝෂිත ආර්ථික රටාවක් අනුක්‍රමයෙන් ගොඩනඟා ගත්හ.

බුදු දහම තුළින් සමාජ සුගතිගාමී නැතහොත් පුද්ගලයාගේ මෙලොව සුබ සිද්ධිය සඳහා හේතුවන ධර්මකාරණා හැරුණු කොට මිහිඳු හිමියන් වැඩමකරණවිට ඒ හා සමාන්තරව

මෙරටට බලපෑ අශෝක ධර්මයන් ද සමාජ සුබසාධනයෙහිලා මහඟු කාර්යභාරයක් ඉටුකර ඇත. මිහඳු හිමියන් විසින් ථේරවාදී බුදු දහම හඳුන්වා දෙමින් ම විශාල භූගෝලීය ඒකකයක් වූ මගධ අධිරාජ්‍යයෙහි ක්‍රියාත්මක වූ සමාජ සුබසාධන ප්‍රතිපත්තීන් මෙරටට ද හඳුන්වා දී ඇත. "දෙවියන්ට ප්‍රිය වූ රජ තෙමෙ සියලු සතුන්ගේ පීඩා රහිත බව ද සංයමය ද සමචර්යාව ද සතුටින් විසීම ද කැමති වෙයි....." (ගුණවර්ධන, 2004:58) යනුවෙන් අශෝක තම ගිරි ලිපි මගින් දක්වා ඇති අන්දමට ම සමාජ සුබසාධනය රජුගේ ප්‍රධාන වගකීමක් ය යන්න දේශීය සංස්කෘතියට ද ආගමනය වී ඇත.

**සම්පත් කළමනාකරණයෙහිලා** බුදු දහමේ ආභාසය සම්න්ධව අධ්‍යයනය කිරීමේදී අධ්‍යාත්මික අංශයට නැඹුරු වූ බෞද්ධ ඉගැන්වීම් තුළින් ආකල්පමය වෙනසක් කරමින් මානව සම්පත ඒකරාශී කොට ආර්ථික සංවර්ධනයට යොමු කළේ කෙසේදැයි යමෙකුට ගැටලුවක් මතුවිය හැකි ය. ධම්ම පදයේ එන ඉසිපතනයේ දී මහධන සිටු පුත්‍රයා අරභයා බුදුන් වහන්සේ දේශනා කළ පහත ගාථාවන් ඒ සඳහා කදිම නිදර්ශක වේ.

"අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං
ජිත්‍තකොංචාවක්‍ඛායන්ති - ඛීණ මච්චේව පල්ලලේ
අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං
සෙන්‍ති චාපාතිඛීණාව - පුරාණානි අනුත්‍ථුනං" *(ධම්මපදය, 2014:97-98)*

මෙමගින් පෙන්වා දෙන ලද්දේ "යමෙක් තරුණ වයසේ සිට එක්කෝ බ්‍රහ්මචර්යාවෙහි හැසිරිය යුතුය. නැතහොත් ධනය ඉපැයිය යුතු ය. එසේ නැති තැනැත්තා මසුන් නැති, දිය සිඳී ගිය විලක් අසල සුසුම් හෙළන කොකෙක් හා සමාන වන්නේ ය. තව ද අනුවණයෝ දුන්නෙන් හරනා ලද ඊතලය වැටුණු තැනම දිරා යන්නාක් මෙන් මහලුව ගිය පසු පැරණි දේ සිහිකරමින් ශෝක වන්නේ ය" යන්නයි. ගිහි පැවිදි සෑම කෙනෙකුගේම ජීවන ගමනේ දී වටිනා කාලය අරමුණක් ඇතිව නිසි පරිදි කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දුන් මෙම ධර්ම කරුණු ලංකාවේ ප්‍රථම මහා විද්‍යා පීඨය වූ මහාවිහාරයේ ධර්ම ශාස්ත්‍රය හැදෑරූ දහස් ගණන් භික්ෂූන් වහන්සේලාගේ විචාර බුද්ධියට හසු වූ අතර උන් වහන්සේලා ගේ මුවින් ගම්-දනව් වැසි ජනයා අතරට ද මෙම ධර්මෝපදේශ ගලා යන විට තරුණ සිත් කුසීත බවින් මුදවා ඉලක්කගත අරමුණක් උදෙසා එකිතැන් කිරීමටත්, ජව සම්පන්න කිරීමටත්, බ්‍රහ්මචාරී නොවූවන්ගේ වටිනා ශ්‍රමය රටේ ආර්ථික උන්නතිය උදෙසා යොමු කර වීමටත් අනුපමේය සේවාවක් සිදු වූ බව සිතීම අතිශයෝක්තියක් නොවේ. මහින්දාගමනයෙන් පසු රාජ්‍ය උපදේශකත්වයට බෞද්ධ භික්ෂුව පත් වීම නිසා මෙවැනි වටිනා උපදේශයන් මහජනයාට පමණක් නොව රාජ්‍ය පාලකයාට ද නිබඳව ලැබුනේ ය. අප රටේ පෙර සිරිත්, සදාචාරය ගොඩනැගුනේ මෙවැනි බුද්ධ දේශනාවන් ගුරුතන්හි තබා ගනිමිනි. සංඝමිත්තාගමනය හරහා මෙරට කාන්තාවට ද සමාජයේ සමානාත්මතාව ලැබ ඇය පුරුෂයාට සමාන මානව සම්පතක් ලෙස සමාජ ඇගයීමට පාත්‍ර වන්නේ ද ක්‍රි.පූ. තෙවැනි සියවසේ වීම සැළකිය යුත්තකි.

බෞද්ධ දර්ශනයෙන් පොදු ජනයාට පමණක් නොව රාජ්‍ය පාලකයින්ට ද රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය කෙබඳු විය යුතුදැයි අනුදැන වදළ හ. නිදසුනක් ලෙස "පළමු කොට

රටවැසියා ජීවත්වීමේ කරදරයෙන් මුදා ගන්නා තුරු රටක් ධාර්මිෂ්ඨ කළ නොහැකි ය. එම නිසා අපේ භික්ෂූන් වහන්සේලා මහජනයාගේ මෙලොව ජීවිත දුකින් තොර කර පරලොව ජීවිතය ගැන පසුව බණ කියන්නට සිතට ගත යුතු ය." යනුවෙන් චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් (**දීඝ නිකාය**, 2013:1064-1087) පෙන්වා දී තිබීම නිසා බුදු දහම මෙරටට හඳුනවා දීමත් සමඟ සමාජයේ සිදු වූ ආර්ථික පුනර්ජීවනයට බෞද්ධ භික්ෂූන් ඍජුව දායක වන්නට ඇතැයි සිතීම යුක්ති සහගත වේ. අනෙක් පසින් බුද්ධ දේශනාවේ යම් යම් අවස්ථාවන්හි කියැවෙන තත් සමාජයේ පැවති තාක්‍ෂණික දියුණුව ක්‍රි.පූ. සවැනි සියවසේ සිට පැමිණි සංක්‍රමණිකයන් හරහාත් විශේෂයෙන් ක්‍රි.පූ. තෙවැනි සියවසේ මෙරටට පැමිණි භාරතීයයන් හරහාත් අප සමාජයට ලැබිණැයි සිතීම සාධාරණ වන්නේ,

"උදකංහි නයන්ති නෙත්තිකා - උසුකාරාක නමයන්ති තේජනං

දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා" *(ධම්මපදය, 54)*

යන ගාථා පාඨය ප්‍රකාරව "තමන් කැමති තැනකට දිය ගෙන යා හැකි දියාළුවන්, දක්‍ෂ හී වඩුවන් හෙවත් යකඩ වැඩ කරුවන්, දැව කර්මාන්තය සිදුකරන අය ....." ආදී ශිල්ප ශ්‍රේණීන් තත් සමාජයේ සිටි බව හැඟී යන හෙයිනි. ක්‍රි.පූ. තෙවැනි සියවසේ සිට මෙකී පිරිස් පිළිබඳ සඳහන් මෙරටින් හමුවන බ්‍රාහ්මී සෙල්ලිපි රැසක සඳහන් වේ.

පොදු මහජනතාවගේ දියුණුව උදෙසා වන උපදෙස් පමණක් නොව රාජ්‍ය පාලනයෙදී පාලක පක්‍ෂය විෂයෙහි ද වැදගත් වන කරුණු කාරණා රැසක් බුද්ධ දේශනාවෙහි අන්තර්ගත වන්නේ ය. නිදසුනක් ලෙස කූටදන්ත සූත්‍ර දේශනාව (**දීඝ නිකාය**, 2001:243) පෙන්වා දිය හැකි ය. එහිදී යහපත් රාජ්‍යය පාලකයෙක් තම රටෙහි ආර්ථික ප්‍රතිපත්තිය ජනතාවට පීඩා නොගෙනෙන සේ සකසා ගතයුතු බව පෙන්වා දී ඇත. ජනතාවට ආහාරපාන සපයා ගැනීම මූලික කටයුත්තක් වන බැවින් රටක ආර්ථික ක්‍රමයක මූලිකත්වය කෘෂිකර්මාන්තයට ලැබිය යුත්තේ ය. එනිසා රටක ආර්ථිකය දියුණු කිරීමට රජු විසින් කෘෂිකර්මාන්තයේ යෙදෙන අයට ධාන්‍ය බීජ හා අහාරාදිය දීමෙන් ද ගොවිතැන හා බද්ධව යන ගව පාලනයේ යෙදෙන්නන්ගේ ගව සම්පත් ආරක්‍ෂා කර දීමෙන් ද වෙළෙඳාමේ යෙදෙන අය උදෙසා විවිධ පහසුකම් ද රාජ්‍ය සේවයේ නියුක්තිකයින්ට නිසි සේ බත් වැටුප් ගෙවීමෙන් ද සහාය විය යුතු බවත් එවිට ඔවුන් තම තමන්ගේ රාජකාර්යයන්හී සතුටින් නියැලෙන බැවින් රාජ්‍යය පීඩාවට හෝ කරදරයට පත් නොවන බවත් රාජ්‍ය ආර්ථිකය ඉහළට එසවෙන බවත් එවිට ඒ ඒ ජනපදයන් හි සොර සතුරු උවදුරු දුරු වී බියෙන් සැකෙන් තොර ජන ජීවිත නිතැතින් ඇති වන බවත් පෙන්වා දී ඇත.

ක්‍රි.පූ. තෙවැනි සියවසේ සිට මෙරට පාලකයින් ආර්ථික ක්‍රියාවලියේ පෙරගමන් කරුවා වූයේ අන් කවරක් නිසාවත් නොව බෞද්ධ ශික්‍ෂණයෙන් ඔවුන්ට ලැබුණු පන්නරය නිසා ය. මෙතැන් සිට කෘෂිකර්මාන්තය, වාරි කර්මාන්තය, වෙළෙඳාම හා සෙසු කර්මාන්තයන්හි නායකත්වය රාජ්‍යය පාලකයාට හිමි වන අතර ඔහු එකී අංශයන්ට විවිධාකාර අනුග්‍රහයන් කරමින් ඍජු ලෙසත් වක්‍ර ලෙසත් සම්බන්ධ වෙමින් රටෙහි ආර්ථික උන්නතියට දිරි දෙන අකාරය විද්‍යමාන වේ. බෞද්ධාගමික ආරාම, දානශාලා ඉදිකිරීම පමණක් නොව ගිහි පැවිදි දෙපිරිසටම ආරෝග්‍යශාලා පිහිටුවමින්, මහා මාර්ග සංවර්ධනය කරමින්, කෘෂි, වාරි තාක්ෂණික දියුණුවක් ඇති කරනුයේ බදු අය කිරීමෙන් රාජ්‍යය භාණ්ඩාගාරයට රැස් වූ ධනය නිවැරදිව පරිහරණය කරමිනි.

ආර්ථික සහ තාක්ෂණික බුද්ධිමය වශයෙන් ඇතිවන වර්ධනය එම ජනයාගේ නිෂ්පාදන ක්‍රමය, ගමනාගමනය, සන්නිවේදනය, ගෘහවිද්‍යා ඇතුළු කලාවන් යන අංශවල ප්‍රගමනයක් ඇතිවීමට හේතුවක් විය. අනෙක් පසින් පූර්ව ඓතිහාසික අවධියේ සිට ක්‍රම ක්‍රමයෙන් මෙරට තාක්ෂණික වර්ධනය සිදු වුවත් ඒ පිළිබඳ පුළුල් තොරතුරු හමුවන්නේ ක්‍රි.ව තෙවැනි සියවසේ සිට හමුවන බ්‍රාහ්මීය සෙල්ලිපි මෙන්ම වංශකථා තොරතුරු මඟිනි. ක්‍රි.පු හයවැනි සියවසේ සිට සිදුවන විශාල ජන සංක්‍රමණ හා තෙවැනි සියවසේ සිදුවුණු ආගමික ප්‍රබෝධය මෙරට බුද්ධිමය හා තාක්ෂණික පිබිදීමකට හේතු වී ඇත. උදාහරණයක් ලෙස බෝධි ආගමනයත් සමඟින් විවිධ කුල ශ්‍රේණීන් (අටලොස්කුල ජනයන්) මහා බෝධියේ ආවතේව පිණිස මෙරටට පැමිණීම දක්විය හැක (**සිංහල බෝධිවංශය**:238-239). එසේම මෙම ජන සංක්‍රමණ ක්‍රි.පු හයවැන්නේ සිට මෙරටට සිදුවෙද්දි ඔවුන් තම භාරත දේශයේ දී තමන් අත්දුටු අත්විදි තාක්ෂණයන් සිය ජීවිකාවෘත්තීය වශයෙන් යොදා ගැනීම ස්වාභාවික ය. ක්‍රි.පු තෙවැනි සියවසින් පසු ලියැවුණු අභිලේඛන මූලාශ්‍ර විග්‍රහ කිරීමෙන් තත් අවධියේ විවිධ ශිල්පීන්හී නිපුණව සිටි ශිල්පි පිරිස්, වෘත්තිකයින් සහ බුද්ධිමතුන් ගැන හඳුනාගත හැකි ය. නිදසුනක් ලෙස ක්‍රි.පු. තෙවැනි සියවසින් පසු ලියැවුණු ලෙන් ලිපිවල අචරිය, අජරිය හා අජිරිය යන වදන් හමුවන අතර ඉන් ආචාර්ය හෙවත් සමාජයේ බුද්ධිමය පාර්ශ්වය දියුණු කල පිරිස් ගැන අසන්නට ලැබේ (*Inscriptions of Ceylon*, 1970:46/No:745:56). මීට අමතරව විවිධ ශිල්පීන් සම්බන්ධ ආචාර්යවරුන් ගැනද තතු හමුවේ. ඇතුන් (හතිඅචරිය) හා අශ්වයන් (අසජරිය) හික්මීම සම්බන්ධ ආචාර්යවරුන් දසු අචරිය හෙවත් දුනු ර්තල නිපදවීම හෝ භාවිතය පිළිබඳ ප්‍රගුණ කල පිරිස් ගැන අභිලේඛන සාක්ෂි හමුවේ (*Ibid*, No:1158:92).

එසේම ක්‍රි.පු තෙවැනි සියවසින් පසු මෙරට කෘෂි කාර්මික හා කාර්මික අංශයන්හි සිදුවු තාක්ෂණික දියුණුව ආර්ථික පිදීමෙහිලා සෘජුවම බලපෑවේ ය. බුදු දහමේ පණිවිඩය දිවයින සිසාරා පැතිරුණු පසු විවිධ කර්මාන්තයන් සඳහා සම්පත් ස්ථානගත වු ප්‍රදේශවල නිවැසි වෘත්තිකයින්, ශිල්පීන් රටපුරා ව්‍යාප්තවන බව පෙනේ. නිදසුනක් ලෙස මැණික් කර්මාන්තය ගතහොත් එම ඛණිජ සම්පත භූගත නොවු මිහින්තලයෙන් ද මණිකර (*Ibid*, No:74:7) හෙවත් මැණික්කරුවන් පිළිබඳ තොරතුරු ලෙන් ලිපි තුළ සටහන්ව ඇත. මිහින්තලය, ගල්ගේ, ගල්ගමුව වැනි මැණික් නොලැබෙන ප්‍රදේශවලින් ද මණිකර වැනි පද හමුවීම හරහා පැහැදිලි වන්නේ එම කර්මාන්තයේ තියුණු විවිධ වෘත්තිකයින් මෙම ප්‍රදේශවල විසු බවයි. එසේම තත් අවධියට අදාල බ්‍රාහ්මී ලිපි කිහිපයක යකඩ වැඩකරුවන් (කබර) (*Ibid*, No:301:24/ No:1049:80.) හෙවත් ලෝකුරුවන් පිළිබඳ සඳහන් වේ. වෙස්සගිරියෙන් ලැබෙන ලෙන් ලිපිවල ද දක්වෙන තලදර යන්න රන්කරුවන් බව පරණවිතානයන්ගේ අදහසයි (ධීරානන්ද හිමි, 2004:167). එසේම ඔහුට අනුව පූර්ව බ්‍රාහ්මී ලිපිවල එන තබකර (*IC*, No:350/351:28) තඹවලින් වැඩ කරන ශීල්පීන් ය.

මීට අමතරව කුඹල් කර්මාන්තය (*Ibid*, No:807:62/No:57:5.) (මිහින්තලයෙන් ලැබුණු ලිපියක කබල තිස (කුම්බකාර තිස්ස) යනුවෙන් සඳහන් වේ) පේෂ කර්මාන්තය (*Ibid*, No:1145:91), කෘෂි නිපැයුම්කරුවන් (*Ibid*, No:576:44/ No:1151:91/ No:1153:92/ No:1216:99) (රුපදක) වැනි කර්මාන්තකරුවන් ගැන සැලකිය යුතු අභිලේඛන සාක්ෂි මේ වනවිට හමුවී ඇත. එබැවින් ක්‍රි.පු තෙවැනි සියවසින් පසු පෙර නොවු තාක්ෂණික වර්ධනයක් රට පුරා ව්‍යාප්ත වු බව පිළිගැනිමට ප්‍රමාණවත් සාක්ෂි අප හමුවේ ඇත. එපමණක් නොව වාරී ක්ෂේත්‍රය හා එතුළින් සංවර්ධනය වු කෘෂිකාර්මික අංශය පිළිබඳවත්

මෙකල පුනර්ජීවනයක් සිදු වූ බවට මෙම සෙල්ලිපි මූලාශ්‍ර සාක්ෂි දරයි. පූර්වයෙහි සඳහන් කළ පරිදි දේශපාලන ස්ථාවරත්වය ඇතිවීමත් සමග රටේ ආර්ථික ජීවනාලිය ලෙස වාරි කටයුතු ප්‍රමුඛ කෘෂිකර්මාන්තය නැංවීම රාජ්‍යය වගකීමක් වීමත් බුදු දහමින් ඒ සඳහා ලැබුණු අනුග්‍රහයත් පදනම් කරගෙන ක්‍රි.පු තෙවැනි සියවසින් පසු එකී අංශයන්හි පැහැදිළි වර්ධනයක් සිදුවන ආකාරයත් හඳුනා ගත හැකිය.

බුදුරජාණන් වහන්සේ විසින් ධාර්මිකව ධනය උපයා ගැනීමටත්, උපයා ගත් ධනය ආරක්ෂා කරගැනීමටත්, මනා කළමනාකාරීත්වයකින් ධනය පරිහරණය කරන ආකාරය පිළිබඳවත් සිඟාලෝවාද සූත්‍රයේ දී උපදෙස් ලබා දී තිබේ.

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය - ද්වි කම්මං පයොජයෙ

චතුත්ථඤ්ච නිධාපෙතුං - ආපදාසු භවිස්සති" *(දීඝ නිකාය:1220)*

තමන් උපයන ධනයෙන් එක් කොටසක් එදිනෙදා පරිභෝජනය සඳහා යොදා ගැනීමටත්, අඩක් සිය කර්මාන්තයෙහි ආයෝජනය කළ යුතු බවටත්, ඉතිරි කොටස හදිසි ලෙඩ රෝගයක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉතිරි කර තැබිය යුතු බවටත්, උන්වහන්සේ දේශනා කළේ ගිහි ජනයාට මනා ආර්ථික කළමනාකරණයක් පුරුදු පුහුණු කර ගැනීම අරඹයා යි. නූතනයේ දිවි ගෙවන ජනයාට ආදායමෙන් එක් කොටසක් දෛනික දිවිපෙවෙත සඳහා කෙසේ නම් ප්‍රමාණවත් වන්නේද? යන ගැටළුව නැගෙනු නිසැක ය. අපට එසේ වන්නේ අප පුරුදු පුහුණු වී ඇත්තේ 'මහාසාර' (Decarative) හෙවත් ආඩම්බරකාරී ජීවන රටාවකට වීමයි. එහෙත් බෞද්ධ අප හුරුපුරුදු විය යුත්තේ බුද්ධ දේශනාවේ කියැවෙන 'සමජීවිකතා' නොහොත් සැහැල්ලු, චාම් දිවි පෙවෙතකට යි. තනි තනි පුද්ගලයින් පමණක් නොව මුළුමහත් සමාජයේම ආර්ථිකය සකස් විය යුත්තේ මෙවැනි දර්ශනයකට අනුරූපව යි. මහින්දාගමනයත් සමඟින් බුදු සමයේ ආභාසය මෙරටට ලැබෙන විට මෙකී ආර්ථික දැක්මෙන් ද නිතැතින්ම අප සමාජය පෝෂණය වන්නට ඇත.

බුදුන් වහන්සේ 'ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ' (**අංගුත්තර නිකාය**, 1977:237) දී පෙන්වා ඇති පරිදි පුද්ගලයෙකුගේ සමාජීය මෙන්ම ආර්ථික ජීවිතය සාර්ථක කර ගැනීමේ දී අංශ හතරක් කෙරෙහි අවධානය යොමු කළ මනා ය. එනම්,

උට්ඨාන සම්පද - යමෙක් කෘෂිකර්මය, වෙළෙඳාම, ගව පාලනය, දුනුවාකම්, රාජ්‍ය සේවය හෝ වෙනත් කර්මාන්ත ජීවිකාවෘත්තීන් සේ කරත්නම් ඒවා උපන් වීර්යයෙන් යුතුව අනලස්ව කළ යුතු ය.

ආරක්ඛ සම්පද - තමන් වීර්යයෙන්, බාහු බලයෙන්, ඩහදිය හෙළා, දැහැමින් ඉපැයූ බෝගයෝ රැකිය මනා ය.

කල්‍යාණමිත්තතා - තමන් ඉපැයූ සම්පත් ආරක්ෂා කර ගත හැක්කේ යහපත් මිතුරු ඇසුර පැවතින විටයි.

සමජීවිකථා - තමන්ගේ අය - වැය ප්‍රමාණ දැන චාම් ජීවන රටාවකට අනුගත වීම.

එනිසා යමෙක් සමබර ආර්ථික තත්ත්වයක් පවත්වා ගෙන යාමට නම් මහත් වීර්යයක්, අරක්ෂණ විධිවිධාන, ඇසුරු කරන පිරිස් හා සැහැල්ලු දිවි පෙවෙත යන කරුණු හතර කෙරෙහි අවධානයක් යොමු කළයුතු වන්නේ ය. තව ද භෝග විනාශයට හේතු වන කරුණු සතරක් ද දේශනා කළ සේක එනම් ස්ත්‍රී ධූත, සුරා ධූත, අක්ෂ ධූත, පාප මිත්‍ර ඇසුර යනු ඒවායි (එම:239). එනිසා පුද්ගලයෙකුගේ ආර්ථික උන්නතිය උදෙසා මෙම දහම් කරුණු බෙහෙවින් සහාය වී ඇති බව පෙනේ. එසේම චුල්ලසෙට්ඨි වැනි ජාතක කථාවලින් මළ මීයකු විකුණා ඉන් ලද සුළු මුදල ආයෝජනය කොට දියුණුවට පත් පුද්ගලයකු (**පන්සිය පනස් ජාතක පොත් වහන්සේ** 1:28-31) අනුසාරයෙන් යමෙකුගේ ව්‍යාපාරයක් සූක්ෂම අයුරින් වර්ධනය කරගන්නා ආකාරය පෙන්වා දී ඇත. එනිසා උන්වහන්සේගේ දහම තුළ මිනිසාගේ පරලොව පමණක් නොව මෙලොව දියුණුව සකසා ගැනීමට අවැසි උපදෙස් ද අපමණව ඇත්තේ ය. බෞද්ධ දර්ශනයෙන් පෝෂණය ලද අශෝක අධිරාජයා ද ස්වකීය දහමක් ලෙස ගොඩනැගූ අශෝක ධර්මය තුළින් පුද්ගලයාගේ මෙලොව සුගතිය මහත් සේ අපේක්ෂා කළ බව පැහැදිලි ය. මෙම දර්ශනයන් ද්විත්වයෙන්ම පෝෂණය ලද මිහිඳු මා හිමියන් මෙරටට ගෙනවිත් ජනගත කළ ආගම මෙරට ජනතාවගේ ධනාත්මක චින්තනය වර්ධනයටත් ඒ හරහා ආර්ථික සමෘද්ධිය නංවාලීමටත් හේතු වී යැයි සිතීම අතිශයෝක්තියක් නොවේ.

'සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා' (සියලු සත්ත්වයෝ අහාරයෙන්ම යැපෙන්නා හුය) යනුවෙන් දේශනා කළ බුදුන් වහන්සේ 'ජිගච්ඡා පරමා රෝගා' (සාගින්න ලොව ඇති භයානකම රෝගයයි) ලෙස දේශනා කරමින් ලොව වෙසෙන සියළු සත්ත්ව වර්ගයාගේ ආහාරමය අවශ්‍යතාවයේ වටිනාකම පෙන්වා වැදෑරූ සේක (**දීඝ නිකාය**:1249-1330).[1] අත්‍යවශ්‍යම සාධකයක් වශයෙන් ආහාර නිෂ්පාදනය කිරීමත්, සකස් කිරීමත් පමණක් නොව පරිභෝජනයෙන් අනතුරුව අතිරික්ත ආහාරයන් පසු අවශ්‍යතාවන් සඳහා ගබඩා කිරීමේ සම්ප්‍රදාය ද දේශීය සංස්කෘතිය විසින් වැළඳගනු ලැබූයේ මෙසේ ඇති වූ බෞද්ධාගමික චින්තන ප්‍රබෝධය හේතුවෙනි.

බුදුන් වහන්සේ මෙසේ පෙන්වා දුන්නේ අන් කවරක්වත් නොව ආහාර සුරක්ෂිතතාවයේ (Food Security) වැදගත්කමයි. නූතන ආර්ථික විශ්ලේෂකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් නව සංකල්ප ලෙස සමාජගත කරන්නේ මෙම බොදුනු සංකල්ප බව පෙන්වා දෙනු කැමැත්තෙමි. ලාංකේය සමාජය තුළ මෙකී බොදුනු අදහස් සමාජගත වනවාත් සමගම දඩයම මුල්කරගත් හිංසාකාරී ප්‍රාථමික ජිවන ක්‍රමය වෙනුවට බෞද්ධ ආගමික මුලධර්ම මත කේන්ද්‍ර වූ කෘෂි කර්මාන්තය මුල්කරගත් ආර්ථික ක්‍රමයක් වටා ගොනුවීමක් දැකගතහැකි විය. මිහිඳු මහ හිමියන් එදා මිස්සක කඳු මුදුනේ සිට තිස්ස රජුගෙන් අඹ ගසක් මුල්කර ගනිමින් ප්‍රශ්න රැසක් අසා වදාරණ ලද්දේ අන් කවරක් නිසා වත් නොව බුදුන් පෙන්වා දුන් මෙම ගැඹුරු දර්ශනයන් ලක්වාසීන්ට ග්‍රහණය කොට ගත හැකිදැයි පරීක්ෂා කොට බැලීමටයි. බුදුන් වහන්සේ බොහෝ අවස්ථාවන්හි කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, සම්ප්‍රදයික කර්මාන්ත,සත්ත්ව පාලනය හා රාජ්‍ය සේවය වැනි ජීවනෝපායන් යහපත් ලෙසත් පොළී ඉපැයීම, විෂ වෙළෙඳාම, ආයුධ වෙළෙඳාම, මාංශ වෙළෙඳාම හා වහල් වෙළෙඳාම අයහපත් අත්හල යුතු කර්මාන්ත ලෙසත් වදාළ සේක. මේ උපදේශයන් යමෙකු කුමන වෘත්තියකට බද්ධ වුවත් ඒ ඕනෑම කටයුත්තකින් දියුණුවට පත්වීමෙහිලා හේතු වන්නේ ය.

## නිගමනය

මේ ආකාරයට දේශීය සමාජ සංස්කෘතියෙහි පැවති අසංවිධිත භාවයට නව අර්ථකතනයක් ලබා දෙමින් මහින්දාගමනයත් සමඟ සිදු වූ දේශපාලනමය, ආකල්පමය සහ බුද්ධිමය වශයෙන් සිදු වූ වර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණික දියුණුවත්, සම්පත් භාවිතයෙහි කළමනාකරණයත් හේතුවෙන් එතෙක් පැවති ආර්ථික පසුබිම විශාල පරිවර්තනයකට ලක් වූ බව හඳුනාගත හැකි වේ. ඉන්දීය මෞර්ය අධිරාජ්‍යයෙහි ආභාසය ලබමින් බුද්ධ දේශනාවන් හී සඳහන් අන්දමට පරලොව ජීවිතයේ විමුක්තිය උදා කරගැනීමෙහිලා ලක්වාසීන් උත්සුඛ වූවාක් මෙන්ම ධර්මානුකූලව කටයුතු කරමින් ලෞකික දියුණුව උදා කරගැනීමෙහිලා පාලක පාලිත දෙපක්ෂයම උත්සහ දරා ඇත. සමෘධිමත් රාජ්‍යයක් බිහිකර ගැනීමෙහිලා පුරාතන පාලකයින් විසින් අනුගමනය කළ උපායමාර්ගයන් අතර මෙකී බෞද්ධ ඉගැන්වීම් බහුලව පැවති හෙයින් මහින්දාගමනය වූ කලී ලාංකේය ආර්ථික සංර්ධනයෙහිලා ප්‍රධාන සංධිස්ථානයක් බව හඳුනාගත හැකි වේ. එබැවින් උක්ත විශ්ලේෂණයන් ප්‍රකාරව ක්‍රි.පූ. තෙවැනි සියවසේදී සිදු වූ මහින්දාගමනයත් සමඟින් මෙරට විවිධ අංශයන් වෙත සිදු වූ බලපෑම විටින් විට සිදුවූ ඉන්දීය සංක්‍රමණවල තවත් එක් හුදෙකලා සිද්ධියක් ලෙස නොසැළකිය හැකි බවත්, එය ලාංකේය ඉතිහාසයේ අනෙකුත් ක්ෂේත්‍රවලට මෙන්ම ආර්ථික විෂය ක්ෂේත්‍රයෙහි ලා නව පරිච්ඡේදයක් සනිටුහන් කළ විප්ලවීය වෙනසක් සිදු කළ විශේෂිත අවස්ථාවක් ලෙසත් පෙන්වාදිය හැකි ය.

## පරිශීලිත ග්‍රන්ථ


**අංගුත්තර නිකාය, පඤ්චම භාගය,** (1977) සංස්:ලබුගම ලංකානන්ද හිමි සහ වෙනත්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, ගෝතමී වග්ගය, ව්‍යග්ගපජ්ජ සූත්‍රය.

**පන්සිය පනස් ජාතක පොත් වහන්සේ 1,** (1995) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මහාවංසය,** (2012) සංස්.හික්කඩුවේ සුමංගල හිමි, බටුවන්තුඩාවේ සහ නන්දදේව විජේසේකර, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**දීඝ නිකාය, තෙවැනි කොටස,** (2013), පරි:ඒ.පී.ද සොයිසා, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

**දීඝ නිකාය,** ප්‍රථම භාගය, (2001), පරි:බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ධම්මපදය,** (2014), සංස්:බඹරන්දේ සිරි සීවලී හිමි, කොළඹ:ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

**සිංහල බෝධිවංශය,** (2018), සංස්:නෝමන් සිරිපාල, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ඉන්ද්‍රකීර්ති සිරිවීර, (2012) **රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි,** කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම,

නදීශා ෂර්මලී ගුණවර්ධන, (2004), **අශෝක අධිරාජයාගේ ප්‍රජා පාලනය,** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

වල්පොළ රාහුල හිමි, (2002) **ලක්දිව බුදු සමයේ ඉතිහාසය,** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

හඟුරන්කෙත ධීරානන්ද හිමි, (2004). **රාජත්වය, රාජ්‍යය සහ ආගම,** වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

හිත්තටියේ ශ්‍රී විමලකීර්ති උදිත හිමි, (1989) **භාරතීය ධර්ම ශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත්,** කොළඹ: ගුණසේන සහ සමාගම

*Epigraphiya Zelanica, Vol. I*, (1943). Ed. By DMDZ.Wickremasinghe, Published by Henry Frowde, London.

Epigraphiya Zelanica, Vol. III,(1943). Ed. By DMDZ.Wickremasinghe, Published by Henry Frowde, London.

Inscriptions of Ceylon, Volume I, (1970). S.Paranavithna, Sri Lanka:Arcaeological survey Department.

Gunawardana R.A.L.H., (1981-82).“Total Power or Shared Power? A Study of the Hydraulic State and its Transformations in Sri Lanka from the Third to Ninth Century A.D.”, *The Indian Historical Review, Vol.VIII*.

Nicholas C.W., (1949).“The Title of the Sinhalerse Kings as Recorded in the Inscriptions of the 3rd Century B.C.to 3rd Century A.C.” *University of Ceylon Review(Peradeniya), Vol.VII.No.04*.